බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සතු

# නිදහස් ආයුර්වේද බෙහෙත්ශාලා ඇගයීමේ නිර්ණායක

පළාත් පාලන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

# හැඳින්වීම

බස්නාහිර පළාතට අයත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මකවන ආයුර්වේද බෙහෙත් ශාලා 120 ක් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික් තුන තුළ පවතින අතර, මෙම බෙහෙත් ශාලාවන්ගේ කාර්යභාරය විධිමත්කර ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම මෙහි දී අපගේ අරමුණ වේ. මේ සඳහා ආයුර්වේද බෙහෙත් ශාලා පවත්වාගෙනයාමට අදාළ නිර්ණායක 2017 වර්ෂයේ සිට ඉදිරිපත් කර එම නිර්ණායක ක්‍රියාත්මක කිරීම තුළින් ඇගයීමට ලක් කිරීම, සේවාවන් කාර්යක්ෂම කිරීමට හා ඵලදායිතාව ඉහළ නැංවීමට පසුගිය කාලය පුරා ඉමහත් ශක්තියක් වූ බව පෙනේ.

ආයුර්වේද වෛද්‍ය විද්‍යාව යනු ධන්වන්තරී ඍෂිවරයාගෙන් ලද දායාදයක් ලෙස සැලකෙන ශාරීරික, මානසික, හා අධ්‍යාත්මික යන කරුණු තුනත් ඒ හා බැඳි චිකිත්සීය පද්ධතිනුත් එක් කොට ඇති ආශ්චර්යමත් චිකිත්සා ශාස්ත්‍රයකි. ඒ තුළින් මිනිසා රෝගවලින් මුදවන ක්‍රම පමණක් නොව, සමාජය රෝගී බවින් තොරව තබා ගැනීමට හා නීරෝගී දීර්ඝ ආයුෂක් ගත කිරීමට අවශ්‍යවන ජීවන දර්ශනයක් ද ලොවට දායාද කරයි.

මේ වන විට Covid-19 වැනි ලෝක වසංගත තත්ත්වයට මුහුණ දීමේ දී පවා ආයුර්වේද ශාස්ත්‍රීය ප්‍රතිකාර රෝග නිවාරණයට නව මානයන් අනාවරණය කරමින් ඉමහත් සේවාවක් ඉටු කරයි. මෙම සියලු කරුණු අවධානයට ගනිමින් තවදුරටත් ප්‍රශස්ත සේවාවක් හා ගුණාත්මක දේශීය ප්‍රතිකාර යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම සඳහා මෙම කාර්ය සාධන ඇගයීම් පිටිවහලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**කසුන් ඈපා සෙනෙවිරත්න**
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත

| අනු අංකය | නිර්ණායක | උපරිම ලකුණු |
|---|---|---|
| 1. | විධිමත් වෛද්‍ය සේවාවක් සැපයීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර තිබීම. | 20 |
| 2. | භෞතික සම්පත් කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 95 |
| 3. | මානව සම්පත් කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 70 |
| 4. | මූල්‍ය කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 45 |
| 5. | ආයතනික සේවා කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 70 |
| 6. | ලේඛන කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 50 |
| 7. | ප්‍රජා සන්නිවේදනයට අදාළ කටයුතු පවත්වාගෙන යාම. | 35 |
| 8. | ඵලදායිතා සංකල්ප අනුව කටයුතු කර තිබීම. | 75 |
| 9. | අදාළ නීති රීති හා ආචාර ධර්ම අනුව කටයුතු කර තිබීම. | 40 |
| | **මුළු එකතුව** | **500** |

## 01. විධිමත් වෛද්‍ය සේවාවක් සැපයීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර තිබීම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 1.1 | නිශ්චිත ක්‍රමවේදයකට අනුව නියමිත කාලයේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | 10 | |
| 1.2. | බෙහෙත් ශාලාවෙහි සංවිධාන ව්‍යුහය ප්‍රදර්ශනය කර තිබීම. | 05 | |
| 1.3. | සේවක නිල ඇඳුම් රාජකාරියේ දී භාවිතා කර සිටීම. | 05 | |
| | **මුළු ලකුණු** | **20** | |

## 02. භෞතික සම්පත් කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 2.1 | ප්‍රදේශයේ ජනතාවට සේවය ලබා ගැනීමට පහසු ආකාරයෙන් බෙහෙත් ශාලාව සකස් කර තිබීම. | 10 | |
| 2.2. | බෙහෙත් ශාලාව සඳහා භාෂාත්‍රයෙන් සකස් කරන ලද නාම පුවරුවක් (විවෘත වන වේලාව සහ දින සහිතව) ප්‍රදර්ශනය කර තිබීම. | 05 | |
| | 2.2.1 රෝගීන්ගේ පහසුව සහ ආරක්ෂාව සුරක්ෂිත වන අයුරින් ආයතන පරිශ්‍රය සහ ප්‍රවේශ මාර්ග නිර්මාණය කර තිබීම.(ආබාධිත පිවිසුම් සහිතව) | 04 | |
| | 2.2.2 ජලය විදුලිය සහ යටිතල පහසුකම් සේවක මණ්ඩලයට හා රෝගීන්ට අරපිරිමැසුම් සහිතව නාස්තිය අවම වන ලෙස කළමනාකරණය කර තිබේ ද? | 04 | |
| | 2.2.3 පරිසරය නිර්මාණශීලීව කළමනාකරණය කර තිබේ ද? | 05 | |
| | 2.2.4 පවත්නා පරිශ්‍රය තුළ පරිසරය සුරැකෙන පරිදි කසළ කළමනාකරණය හා ප්‍රතිචක්‍රීයකරණය කිරීම. (උදා.අප ජලය ප්‍රයෝජනයට ගැනීම, ඔසු පැලවලට යෙදීම හෝ වෙනත්.) | 03 | |
| | 2.2.5 කසළ වර්ගීකරණය කර නිසි පරිදි විධිමත්ව බැහැර කිරීම. (ඩෙංගු වැනි රෝග බෝවීමට ඉඩ නොතබා) | 03 | |
| | 2.2.6 ඉවතලන කසළවලින් මූල්‍යමය වටිනාකම් උපයා තිබේ ද? | 02 | |
| | 2.2.7 සායනික අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීමට කටයුතු යොදා තිබීම. (ආරක්ෂිතව පිළිස්සීම හෝ පූතික වළකට යොමු කිරීම) | 02 | |
| 2.3 | රෝගීන් ලියාපදිංචි කිරීම හා අදාළ වාර්තා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා සුදුසු පරිදි කාර්යාල පරිශ්‍රය පවත්වාගෙන යාම. | 02 | |
| 2.4 | රෝගීන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍යවරයාට ගැලපෙන පරිදි විධිමත්ව සකස් කරන ලද අංශයක් පවත්වාගෙන යාම. | 05 | |
| | 2.4.1 රෝගීන් පරීක්ෂාවට අදාළ මෙවලම් සපයා තිබීම (උදා: වෙදනලාව, උණකටුව, රුධිර පීඩන මානය, හා වෙනත්.) | 02 | |

| | | | |
|---|---|---|---|
| | 2.4.2 වෛද්‍යවරයාගේ සෞඛ්‍ය තත්ත්වය සුරැකෙන පරිදි අදාළ පහසුකම් සැපයීම. (අත් ආවරණ, මුඛ ආවරණ, විෂබීජ නාශක, ජල කරාමය) | 02 | |
| | 2.4.3 රෝගීන් ලියාපදිංචිය සහ ලේඛන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම (මුද්‍රිත ආකෘති පත්‍ර භාවිතය අදාළ ලේඛන සුරක්ෂිතව ගබඩා කර තිබීම.) | 02 | |
| | 2.4.4 රෝගියාට පහසුවන අයුරින් ඖෂධ භාවිතයට අදාළ උපදෙස් ලබා දීමට කටයුතු කර තිබීම. | 02 | |
| | 2.4.5 ආයතනයට පැමිණෙන රෝගීන් සඳහා යම් ඖෂධ පරිශ්‍රය තුළ ම සපයා ගැනීම (මැල්ලුම්, පත්තු.) | 05 | |
| | 2.4.6 ඖෂධ නිකුත් කිරීම හා අසුරා තැබීමට ප්‍රමිතියෙන් යුතු භාජන සහ උපකරණ ලබා දී තිබීම. (උදා: වීදුරු මිනුම් සරා, ලෝහමය හැඳි, පුනීල යනාදිය) | 02 | |
| | 2.4.7 විශේෂ වූ රෝග සඳහා ප්‍රතිකාර ක්‍රම අනුගමනය කර තිබීම. ( උදා: සුදු කබර, කටුචිකිත්සා.......) | 05 | |
| | 2.4.8 රෝගියාගේ පෞද්ගලිකත්වය ආරක්ෂාවන පරිදි පරීක්ෂාවට පහසුකම් සපයා තිබීම. (උදා:තිර සහිත ඇඳ) | 02 | |
| 2.5 | රෝගියාට රැඳී සිටීමට පහසුකම් සහිත ස්ථානයක් තිබීම. | 04 | |
| | 2.5.1 රැඳී සිටින කාලය තුළ (Waiting Time) රෝගියාගේ දැනුම වර්ධනය වන උපක්‍රම භාවිතය. | 05 | |
| 2.6 | ඖෂධ ලබා ගැනීම් නිකුත් කිරීම් දෛනිකව තුලනය කිරීම හා එයට විධිමත් ක්‍රමවේදයක් පැවතීම. | 04 | |
| | 2.6.1 ඖෂධ නිකුත් කිරීම සඳහා පරිසර හිතකාමී හා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද සකසා තිබිම. / පොලිතීන් භාවිතය හැකිතාක් අවම කිරීම ඉතා වැදගත්ය. (උදා: තෙල් කඩදාසි භාවිතය) | 04 | |
| 2.7 | ආයුර්වේද බෙහෙත් ශාලාව සතු භෞතික උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර තිබීම. | 02 | |
| | 2.7.1 සියලු උපකරණ සහ ඖෂධ වාර්ෂික සමීක්ෂණයට භාජනය කර තිබීම හා සමීක්ෂණ නිර්දේශ මාස 03 ඇතුළත ක්‍රියාත්මක කර තිබීම. | 05 | |
| 2.8 | වෙන වෙන ම විශේෂ සායන හෝ ජංගම සායන පැවැත්වීම සඳහා පහසුකම් සපයා තිබීම. | 04 | |
| | **මුළු ලකුණු** | **95** | |

## 03. මානව සම්පත් කළමනාකරණයට අදාළව කටයුතු පවත්වාගෙන යාම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 3.1 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය සඳහා බඳවාගත් සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියෙකු සිටීම. | 10 | |
| 3.2. | බෙහෙත් ශාලාව සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් ලබා දී තිබීම. (ඖෂධ සංයෝජක ඇතුළුව) | 10 | |
| 3.3 | කාර්ය මණ්ඩල පුහුණුව සඳහා විධිමත් ක්‍රමවේද සලසා තිබීම හෝ ඔවුන් ලබා ගත් පුහුණුවලට අනුව සේවාව ප්‍රවර්ධනය කර තිබීම. | 10 | |
| 3.4 | ආයතනයේ ලොග් සටහන් ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාම. | 05 | |
| 3.5 | කාර්ය මණ්ඩලයේ නිවාඩු ආවරණය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් පැවතීම. (උදා: සුදුසුකම් ලත් ආදේශක වෛද්‍යවරු සේවයේ යෙදවීම.) | 10 | |
| | **මුළු ලකුණු** | **45** | |

## 04. මූල්‍ය කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 4.1 | අදාළ වර්ෂය සඳහා ඖෂධ මිලදී ගැනීමට ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබීම.<br>(පෙර වසරට සාපේක්ෂව ගණනය කර තිබිය යුතුය.) | 20 | |
| | 4.1.1 ආයුර්වේද දෙපාර්තමේන්තු ආධාර සහ සභා අරමුදල් නිසි පරිදි ලබාගෙන තිබීම. | 20 | |
| 4.2 | පිරිවැය හා තත්ත්වය පිළිබඳව හැඟීමකින් යුතුව ප්‍රමාණවත් පරිදි ඖෂධ නියම කිරීම හා ඖෂධ කළමනාකරණය. | 10 | |
| 4.3 | ආයුර්වේදය මගින් සිදුකරන බාහිර වැඩසටහන්වල මූල්‍ය කටයුතු මැනවින් පවත්වාගෙන ගොස් තිබීම. | 10 | |
| 4.4 | ආයතන වෙත ලැබෙන පරිත්‍යාග නිසි පරිදි ලේඛන ගත කර ඵලදායිව යොදවා තිබීම. | 10 | |
| | **මුළු ලකුණු** | **70** | |

## 05. ආයතනික සේවා කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 5.1 | ආයතනය පවත්වාගෙනයාමේ දී නියමිත වේලාවට බෙහෙත් ශාලාවේ රාජකාරී ආරම්භ කිරීම හා අවසන් කිරීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කර තිබේ ද? | 10 | |
| | 5.1.1 ආයුර්වේද සේවයට අදාළව චක්‍රලේඛ හා ලිඛිත උපදෙස් පිළිබඳ අවධානය යොමු කර තිබේ ද? | 07 | |
| 5.2 | ඔසු උයන් පවත්වාගෙනයාම සහ ඒවායින් ලබා ගන්නා අමු ඖෂධ රෝගීන්ට ලබා දීම. | 06 | |
| 5.3 | පාසල් හා උසස් අධ්‍යාපනය ලබන සිසුන් සඳහා දැනුවත් කිරීම් සිදු කිරීම. | 05 | |
| 5.4 | රෝගීන් දැනුවත් කිරීම සඳහා විශේෂ වැඩසටහන් සංවිධානය කොට තිබීම. (ආයුර්වේද සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන) | 06 | |
| 5.5 | ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ලෙස | | |
| | 5.5.1 අවම වශයෙන් කාර්තුවකට එකක්වත් ජංගම සායන පවත්වා තිබීම. | 06 | |
| | 5.5.2 කාලීන රෝග නිවාරණ කටයුතු සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වීම.( ඩෙංගු , කොරෝනා) වැනි රෝග. | 06 | |
| | 5.5.3 රෝගීන් වෙත ඔසු පැන් ,කොළකැඳ ආදිය ලබාදීමේ ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබීම. | 04 | |
| 5.6 | ආයුර්වේද සේවයේ ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති යෝජනා ආයතන වෙත ඉදිරිපත් කොට තිබීම. | 04 | |
| 5.7 | පර්යේෂණ කටයුතු මගින් වඩාත් ඵලදායි ප්‍රතිකාර ක්‍රම සොයාගෙන තිබීම. | 05 | |
| 5.8 | කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය වීම සඳහා කටයුතු කර තිබීම. | 05 | |
| 5.9 | වෛද්‍ය නිලධාරීන්ගේ හා කාර්ය මණ්ඩලයේ වෘත්තීය ගැටලු විසඳීමට ආයතනය කටයුතු කර තිබීම. | 06 | |
| | **මුළු ලකුණු** | **70** | |

## 06. ලේඛන කළමනාකරණයට අදාළ කටයුතු පවත්වාගෙන යාම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 6.1 | ලිපිගොනු ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම.<br>(පහත සඳහන් ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම) | | |
| | 6.1.1 පැමිණීමේ ලේඛනය | 03 | |
| | 6.1.2 බැහැර යාමේ ලේඛනය | 03 | |
| | 6.1.3 වෛද්‍ය සහතික නිකුත් කිරීමට අදාළ ලේඛනය | 03 | |
| | 6.1.4 ඉන්වෙන්ට්‍රි ලේඛනය | 03 | |
| | 6.1.5 සුළු මුදල් ලේඛනය | 03 | |
| | 6.1.6 ලොග් සටහන් ලේඛනය | 03 | |
| | 6.1.7 තොග ලේඛනය | 03 | |
| | 6.2.8 නිෂ්පාදිත ඖෂධ සටහන් ලේඛනය | 03 | |
| | 6.2.9 වියළි බෙහෙත් සටහන් ලේඛනය | 03 | |
| | 6.1.10 රෝගීන් ලියාපදිංචි කිරීමේ ලේඛනය | 03 | |
| 6.2 | 6.2.1 ජංගම සායන රෝගීන්ගේ ලියාපදිංචි ලේඛනය | 03 | |
| | 6.2.2 සායන රෝගීන්ගේ ලියාපදිංචි ලේඛනය | 03 | |
| 6.3 | 6.3.1 ඖෂධ වැයවීම හා වියදම් විස්තරාත්මකව හා සාරාංශ ලෙස ඇතුළත් ලේඛනය | 03 | |
| | 6.3.2 ඖෂධ ඇණවුම් ලේඛනය | 03 | |
| | 6.3.3 රෝගීන්ගේ පැමිණීම මාසිකව ඇතුළත් කරන ලද සංඛ්‍යා ලේඛනය | 03 | |
| | 6.3.4 පරිත්‍යාග ලේඛනය | 02 | |
| | 6.3.5 කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුර සඳහා රාජකාරී ලැයිස්තුවක් පැවතීම. | 03 | |
| | **මුළු ලකුණු** | **50** | |

## 07. ප්‍රජා සංනිවේදනයට අදාළ කටයුතු පවත්වාගෙන යාම.

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 7.1 | සන්නිවේදන සේවාවක් ලෙස,<br>● විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා තොරතුරු සපයා තිබීම. (රූපවාහිනි, ගුවන්විදුලි වැඩසටහන්වලට සහභාගි වීම, ප්‍රකාශන අත්පත්‍රිකා සකස් කිරීම, සඟරා සඳහා ලිපි ඉදිරිපත් කිරීම). | 10 | |
| 7.2 | බාහිර ආයතන සමඟ සම්බන්ධ වී තිබීම.(පොලිසිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,....වැනි) ආයතන | 10 | |
| 7.3 | ආයතනික උපදේශන සංවර්ධන කමිටු පවත්වාගෙන යාම. | 10 | |
| 7.4 | ආයුර්වේද ස්වේච්ඡා කණ්ඩායම් ගොඩනැගිම හා සම්බන්ධීකරණය කිරීම. ( ඔසු පැළ රෝපනයට, ඖෂධ එක්රැස් කර දීම ආදී ලෙස) | 05 | |
| | **මුළු ලකුණු** | **35** | |

## 08. ඵලදායිතා සංකල්ප අනුව කටයුතු කර තිබීම

| අනු අංකය | | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|---|
| 8.1 | | පංච විධ සංකල්ප අනුව, | | |
| | 8.1.1 | ආයතනය තුළ අනවශ්‍ය දෑ ඉවත් කර තිබීම. (කල්පිරුණු ලිපි ලේඛන ,කැඩීබිදී ගිය භාණ්ඩ ආදිය.) | 03 | |
| | 8.1.2 | සෑම අංශයක්ම /ඒකකයක්ම හැඳින්වීම සඳහා අංක හා නාම පුවරු පැවතීම. | 03 | |
| | 8.1.3 | සියලුම ලිපිගොනු පොදු 31 ආකෘතියට අනුව සකස් කර මැනවින් පවත්වාගෙන යාම. | 03 | |
| | 8.1.4 | භාණ්ඩ ආදිය ක්‍රමවත්ව, ස්ථානයේ අංලකාරය රැකෙන පරිදි ස්ථානගත කර තිබීම. | 03 | |
| | 8.1.5 | සියලුම විදුලි බල්බ, ස්විච්, විදුලිපංකා, උපකරණ වර්ණ කේත භාවිතා කරමින් අංක යොදා තිබීම. | 03 | |
| | 8.1.6 | ඵලදායිතා සංකල්ප ආයතනය අනුව පවත්වාගෙන යාම | 06 | |
| | 8.1.7 | යතුරු රැඳවුම් පුවරුවක් දක්නට ලැබීම. | 03 | |
| | 8.1.8 | පවත්නා ඉඩම තුළ රථ වාහන නැවැත්වීම සඳහා පහසුකම් සැපයීම. | 03 | |
| | 8.1.9 | First in First out (FIFO) ක්‍රමය ක්‍රියාත්මක වීම. | 04 | |
| | 8.1.10 | සෝදිසි කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර තිබීම. | 03 | |
| | 8.1.11 | ඵලදායීතා තරග සඳහා ඉදිරිපත්වී තිබීම. | 03 | |
| | 8.1.12 | වාචික හා ලිඛිත ප්‍රශංසා සහතික ,ත්‍යාග ලබා දී තිබීම. | 06 | |
| | 8.1.13 | දැනුම හා අත්දැකීම් හුවමාරු කරගෙන තිබීම. | 04 | |
| 8.2 | 8.2.1 | ආයුර්වේද බෙහෙත් ශාලාවල, ශක්තීන් හඳුනා කටයුතු කර තිබීම. | 05 | |
| | 8.2.2 | දුර්වලතා හඳුනා කටයුතු කර තිබීම. | 05 | |
| | 8.2.3 | අවස්ථා හඳුනා කටයුතු කර තිබීම. | 04 | |
| | 8.2.4 | තර්ජන හඳුනා කටයුතු කර තිබීම. | 04 | |
| | 8.2.5 | ප්‍රජාව තෘප්තිමත් වන ආකාරයේ සේවාවන් ඉටු වන බව අහඹු නියදි මගින් නිරීක්ෂණය කළ යුතුය. (අවම වශයෙන් රෝගීන් 05 දෙනෙකුවත් ගෙන) | 10 | |
| | | **මුළු ලකුණු** | **75** | |

## 09. අදාළ නීති රීති හා ආචාර ධර්ම අනුව කටයුතු කර තිබීම

| අනු අංකය | නිර්ණායක | එක් එක් නිර්ණායක සඳහා උපරිම ලකුණු | බෙහෙත් ශාලාව ලබාගත් ලකුණු |
|---|---|---|---|
| 9.1 | ලබා දී ඇති රාජකාරි ලැයිස්තුවට අනුව රාජකාරි පවරා තිබීම. | 16 | |
| 9.2 | රෝගීන් අපහසුතාවයට පත් නොවන ආකාරයෙන් අවස්ථානෝචිතව ප්‍රතිකාර ලබා දීමට ක්‍රියා මාර්ග ගෙන තිබීම. | 08 | |
| 9.3 | කාලින වසංගත රෝග වළක්වා ගැනීම සඳහා නියමිත සෞඛ්‍ය නීති පිළිපැදීම පිළිබඳව මනා අවබෝධයක් තිබීම. | 08 | |
| 9.4 | කාර්යය මණ්ඩලය තෘප්තිමත්ව සේවාවන් ඉටු කරන්නේද? යන්න පසු විපරම් සිදු කිරීම. | 08 | |
| | **මුළු ලකුණු** | **40** | |



**01. ආයුර්වේද බෙහෙත් ශාලාව**

I. නම : ..........................................................................................................................................

II. ලිපිනය : ....................................................................................................................................

III. අයත් පළාත් පාලන ආයතනය : ........................................................................................

IV. අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .........................................................................

V. අයත් දිස්ත්‍රික්කය : .......................................................................................................

VI. දුරකථන අංකය : ...........................................................................................................

VII. විද්‍යුත් තැපෑල : ..........................................................................................................

**02. ආයතනය භාර වෛද්‍ය නිලධාරීගේ**

I. නම : ..........................................................................................................................................

II. තනතුර : ....................................................................................................................................

III. සුදුසුකම් : ..............................................................................................................................

IV. සේවා කාලය : ...........................................................................................................................

V. පෞද්ගලික ලිපිනය : .....................................................................................................

VI. දුරකථන අංකය : ...........................................................................................................

VII. විද්‍යුත් තැපෑල : ..........................................................................................................

**03.** බෙහෙත් ශාලාවේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව : ..........................................................

**04.** දුර්වලතා :

1. ..........................................................................................................................................

..........................................................................................................................................

2. ..........................................................................................................................................

..........................................................................................................................................

3. ..........................................................................................................................................

..........................................................................................................................................

**05.** නව යෝජනා :

1. ..........................................................................................................................................

..........................................................................................................................................

2. ..........................................................................................................................................

..........................................................................................................................................

3. ..........................................................................................................................................

..........................................................................................................................................

**06.** නිර්ණායක අධීක්ෂණ කමිටුවේ නිර්දේශ :

| සාමාජිකයාගේ නම | සේවා ආයතනය | තනතුර | අත්සන | දිනය |
|---|---|---|---|---|
| | | | | |